# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 ජනවාරි මස 23 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.37 ට සභාව රැස් විය. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
කොලන්නගේ වජිර පෙරේරා
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
මහේෂ් අල්මේදා
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රවීන්ද්‍ර යසස් කුමානායක
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සලෝචන ගමගේ
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අශෝක දයාරත්න
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
උදාර රත්නායක
උපාලි ගුණරත්න
එස්.එම්. සකාවුල්ලා
කාමල් කුරුප්පු
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
ජගත් පී. විතාන
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂන් පාදුක්ක
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සහන් ප්‍රදීප්
සුනිල් ජයමිණි
සුසාර දිනාල්
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ සංකල්පයක් පරිදි මුද්‍රණය කරන ලද මෙම පළාත් සභාවට අදාළ 1988 සිට 1995 දක්වා පළාත් සභා ප්‍රඥප්ති - වෙළුම I නම් ග්‍රන්ථයේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ පරිහරණය පිණිස බෙදා දෙනු ලබන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී."*

*ii*

*"2017.12.12 දින සභා සම්මත වූ 2018 වර්ෂයට අදාළ මුදල් ප්‍රකාශය හා සම්බන්ධ 2017 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තියට 2017.12.14 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලබා දී තිබෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

*"සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම හේතුකොටගෙන, මෙම පළාත් සභාවේ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ ඇති වූ සාමාජික පුරප්පාඩුව සඳහා ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා 2018.01.23 දින සිට පත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

ගරු සභාපතිතුමා විසින් 2018.01.10 වැනි දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සභාවට පිළිගන්වන ලදී.

## 03. පළාත් සභාවේ රැස්වීම :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ගරු සභාපතිතුමනි, අද දින (2018.01.23 වන දින) විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව, 2018.02.20 දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු අතර, 2018.02.06 වන (අඟහරුවාදා) දිනය, සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතු ය."*

## 04. පළාත් සභාවේ කටයුතු :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ගරු සභාපතිතුමනි, අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතු ය."*

## 05. බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවනවර කියැවීම

ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී .

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2018 අංක... දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන)ප්‍රඥප්තිය දෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 10.29 ට, පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පත් විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.***

## 06. බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය : තුන්වන වර කියැවීම

ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී .

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2018 අංක... දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන)ප්‍රඥප්තිය තුන් වන වර කියැවීම සඳහා සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***

***පූ.භා. 10.32 ට, පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත්විය.***

***පූ.භා. 10.33 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 07. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද, යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"ශ්‍රී ලංකාව තුළ විවෘත ආර්ථික වෙළඳපොළ හඳුන්වාදීමත් සමග පරිභෝජනවාදය සීඝ්‍රයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස බැහැර කරන කැළි කසළ ප්‍රමාණය සීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. එසේ බැහැර කරන කැළි කසළ වල දිරාපත් නොවන ලන්ච් ෂීට්, සිලි බෑග්, රෙජිෆෝම්, පොලිතින් විශාල වශයෙන් එක් වූ අතර, එහි ප්‍රතිඵලයක ලෙස දිරාපත් වන කසළ දිරාපත්වීම ප්‍රමාදවීමට මෙය හේතු වූ අතර, පරිසරයටත්, සමාජයටත් මානව පැවැත්මටත් වෙනත් සත්ව කොටස් වලටත් බහුවිධ බලපෑමක් එක් කළ අතර, දිරාපත් නොවී කුණු කඳු ගොඩගැසීම නිසා විශාල ඛේදවාචකයක් සහ ජීවිත හානි ද සිදු විය.*

*කසළ බැහැර කිරීමට, දිරාපත්වීමට, ප්‍රතිචක්‍රීකරණයට හා කොම්පෝස්ට් නිෂ්පාදනයට ලන්ච් ෂීට්, සිලි බෑග්, රෙජිෆෝම්, පොලිතින් විශාල ප්‍රමාදයක් හා බාධකයක්, ව්‍යසනයක්, ඇති කරන බැවින් ඒවා නිෂ්පාදන කිරීම, විකිණීම හා භාවිතය තහනම් කිරමින් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය ගනු ලැබූ තීරණය අපේ රටේ අනාගතය, අනාගත පරපුර හා පරිසරය සම්බන්ධ ඵලදායි ප්‍රතිපත්ති තීරණයක් ලෙස පැසසුමට හා අගය කිරීමට ලක් කරන අතර රට වෙනුවෙන් මෙම පොලිතින් තහනම ක්‍රියාත්මක කිරීමටත් ඊට අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමටත්, බස්නාහිර පළාත් සභාවේ සහය පළ කළ යුතු යැයි යෝජනා කරමින්, මෙම ප්‍රතිපත්ති කවර බලපෑමක් නිසාවත් ආපස්සට නොහැරවිය යුතු යැයිද, පරිසර හිතකාමී විකල්ප ආදේශන ප්‍රවර්ධනය කිරීමටත්, ජනගත කිරීමටත් කඩිනමින් කටයුතු කළ යුතු යැයිද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

## 08. **කල් තැබීමේ යෝජනාව :**

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.16 ට, 2018 පෙබරවාරි මස 20 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.01.23
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/23

*"බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ සංකල්පයක් පරිදි මුද්‍රණය කරන ලද මෙම පළාත් සභාවට අදාළ 1988 සිට 1995 දක්වා පළාත් සභා පුඥප්ති - වෙළුම I නම් ග්‍රන්ථයේ පිටපත් එතුමන්ගේ උපදෙස් පරිදි පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ පරිහරණය පිණිස බෙදාදීම පිණිස යොමු කරන බව ආණ්ඩුකාර ලේකම්තුමා විසින් සහා ලේකම්තුම වෙත අංක GOS/ADM/09 හා 2018.01.18 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බවත්, එම ග්‍රන්ථයේ පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන් වෙත සභා කාර්ය මණ්ඩලය මගින් ලබා දීමට කටයුතු සලස්වා තිබෙන බවත්, මෙවන් උත්කෘෂ්ඨ කාර්යයක් ඉටු කරලීම සඳහා පුරෝගාමී වීම පිළිබඳව එමෙන්ම ගරු ආණ්ඩුකාරතුමාණන්ට විශේෂ ස්තූතියක්, ප්‍රශංසාවක් පළ කර සිටින බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී."*